- පසුගිය සතියේ අපි කියවපු “අපේ පන්සලේ ශ්‍රම දානය” පාඩම නැවත ශබ්ද නගා කියවමුද ? දැන් දුවල පුතාලට හොඳින් කියවන්න පුළුවන් නේද ?

දුවේ, පුතේ අප බලමු පහත ලියා ඇති වචන ශබ්ද නගා කියවන්න පුළුවන්ද ? කියලා

විහාරස්ථානය

ශ්‍රමදානය

කණ්ඩායම

උපකරණ

ක්‍රමානුකූලව

පුණ්‍යානුමෝදනා

සංවිධානය

හොඳ දුවල, පුතාල වගේ බුද්ධාගම පොතේ පාඩම පෙරළාගෙන මේ වචන සොයා යටින් ඉරක් අඳින්න.

දැන් ඒ වචන බුද්ධාගම අභ්‍යාස පොතේ ලස්සන අත් අකුරින් ලියන්න.

දැන් වැඩිහිටියන්ට ඔයාලගෙන් මේ ප්‍රශ්න අහන්න කියන්න. දුවල පුතාල මතකයෙන් උත්තර දෙන්න.

1. ශ්‍රමදානය සංවිධානය කළේ කවුද ?

2. ශ්‍රමදානය අවසන් වූ පසු හැමදෙනාගේම සිතට දැනුනේ කුමන හැඟීමක්ද ?

3. “ශ්‍රම දානය බොහොම හොඳයි” කියා පුණ්‍යානුමෝදනා කළේ කවුද ?

4. ලොකු හාමුදුරුවෝ දේශනා කළ පරිදි කඩිසරව වැඩ කළේ කවුද ?

5. පන්සලේ ශ්‍රමදානයට සහභාගී වූ පිරිස කවුද ?

දුවට පුතාට තෙරුවන් සරණයි !